# ග්‍රහපූජාවයි - විලියොන් මාමයි

මා උදේ ම පොල් ගසකට නැග ගොක්අතු දෙකක් කැපුවේ ය. අල්ලිස් මාමා කර ගහගෙන ආ කෙසෙල් කඳක් මිදුල මැදට අතහැරියේ ය. ඒරොන් මාමා කෝටු මිටියක් ගෙනැවිත් බිත්තියට හේත්තුකොට, ජටාව බැඳ තිබූ ලේන්සුව ගලවා ඉවතට ගසා කර පිසදා ගත්තේ ය. පුවක්මලක් ගෙනාවේ රොමියෙල් බාප්පා ය. වෙනදාට වඩා ක්‍රමානුකූලව මිදුල අතුගෑ පියසීලි පොඩිඅම්මා හැඩි කළ අයට බණිමින් කුණු රොක්කර පිළිකන්න පැත්තට ගෙන ගියා ය. පුරුද්දක් ලෙස වෙනදාට ගෙදරට සීනි කාලක් ගෙනෙන ආච්චි අද ගෙනා සීනිමුළ වෙනදාට වඩා තරමක් ලොකු ය. ආතා පිරිසිදු බැනියමක් ඇඳගෙන උරහිස මත ඇති පටි දෙක ගැට ගසා ගත්තේ ය. මම රෙද්දක් ඔළුවේ සිට පොරවාගෙන කකුල් දෙකත් උඩට අරගෙන හාන්සිපුටුවේ වක ගසාගෙන විපරම් මුහුණින් යුතුව සිටියෙමි.

උදේ දහයට දහයමාරට විතර විලියම් මාමා පැමිණ "නෝමිස්ලගෙ තාත්ත කොහේ යන්නද මේ හදන්නෙ" කියාගෙන ගෙට ගොඩ වී ලොයිබංකුවෙන් වාඩි වීමට හදන විට ආච්චි කලබලයෙන් පුටුවක් ගෙනැවිත් තබා"මෙහෙන් වාඩිවෙන්න විලියොන්සිංඤෙදා" යි පැවසුවා ය.


රෙදි පොට්ටනියක් හිස පිට තබාගෙන ආ රෙදිනැන්දා පොට්ටනිය බිමින් තබා දිගහැර සුදුරෙදි කීපයක් අතට ගෙන එම් පොඩිඅම්මා අතට දෙනවිට ආච්චි මිටි බංකුව ගෙනැවිත් අයිනට වෙන්නට තැබුවේ ඇයට වාඩි වීමට ය.

බොහෝ පළාත්වල යකැදුරු මහත්වරු, කපු මහත්වරු බොහෝ ගෞරවයෙන් සලකන පළාතේ ඉතාම කීර්තිමත් නමක් දරා සිටි විලියම් මාමා ග්‍රහ පූජා ශාන්ති කර්මය ඉතාමත් හොඳින්, බොහෝ ප්‍රතිඵල ලබන ආකාරයෙන් කරන කට්ටඩි මහතෙකු ලෙස මුළු පස්යොදුන් කෝරළයේ පමණක් නො ව බොහෝ දුරබැහැර පළාත් වල ද ප්‍රසිද්ධ ය. මානාන ප්‍රදේශයේ පදිංචිව සිටි විලියම් මාමා අවිවාහකයෙකි. තරුණ කාලයේදී ඔහුට විවාහ යෝජනාවන් ගෙනෙනවාටත් අකැමැත්තෙන් සහ අප්‍රසන්න හැඟීමෙන් සිටි බව දන්නෝ කියති. ඉතාමත් කරුණාවන්ත අයෙකි. මුහුණ උල් ය. පට සරම සහ ජාතික බැනියම ඇඳ ඊට උඩින් සාළුවක් කරේ දමා ගැනීම ඔහුගේ සුපුරුදු ඇඳුම ය. මුවඅත ඉතාමත් තියුණු පුංචි පිහියක් ඉනේ ගසාගෙන සිටින්නේ පුවක් ලියා ගැනීමට සහ ගොක් කොළ, කෙසෙල් පතුරු ආදිය කැපීමට ය.

අපේ ගමේ සිටි තවත් ප්‍රසිද්ධ යකැදුරු මහතෙකි, හරොංසිංඤෙද්‍රා කට්ටඩි මාමා. නාහල්ලේ ඇක්මන් කට්ටඩි මාමාත් හොඳ නරක දෙකට ම හොඳ අයෙකු හැටියට ප්‍රසිද්ධ ය. විලියම් මාමාත් හරොංසිංඤෙද්‍රා මාමාත් දැන් ජීවතුන් අතර නැත. ඇක්මන් මාමා පැලවත්ත පළාතේ දරු මුනුපුරන් මැද වයෝවෘද්ධව ජීවත්වෙයි.

විලියම් මාමා ඇඳ සිටි ජාතික බැනියම සහ උඩින් ඇඳ සිටි සරම ගලවා ග්‍රහපූජාවට අවශ්‍ය පරිසරය ගොඩ නැගීම ඇරඹී ය. කෙසෙල් ගසේ පතුරු ගලවා එක පැත්තකින් තබා, ඊ ළඟට ගොක්කොළ කීපයක් අල්ලා කපා එකට ගැට ගසා මිටි වශයෙන් පැත්තක තැබුවේ ය. ඉන්පසු කෝටු තුන බැගින් ගෙන වල්ල පට්ටාවලින් මැදින් ගැට ගසා, වියූ ගොක්අතු රවුම්කර "මල්පැල" කීපයක් හැදුවේ ය. මෙම වැඩ සඳහා, ගමේ බොහෝ දෙනා ''ඩේවිටයියා'' යනුවෙන් අමතන, සොහොන කඩේ අසල නිවසක පදිංචිව සිටි ඩේවිඩ් බාප්පා උදපදව් කරයි. බොහෝවිට විලියම් මාමා ගුරුකම් වැඩකට පිටත්වන විට ඔහුවත් කැඳවාගෙන යන්නේ තොවිල්පෙවිල් කටයුතුවල දී කොට්ටෝරු උන්නැහේගේ රාජකාරිය හුරුපුරුදුව සිටි කෙනෙකු නිසා විය හැකි ය. ඩේවිඩ් බාප්පා කතාවට චතුර හැකියාවක් ඇති, අසා සිටින්නවුන් අමන්දානන්දයට පත්වන අයුරින් කතාකරන ගමේ බොහෝ දෙනාගේ ආදරය දිනාගත් අයෙකි.

විශේෂයෙන් සෑදූ තවත් මල් ආසනයක් විය. එය අනිත් මල්පැලවලට වඩා ලොකු ය. අඩි එකහමාරක් පමණ පළල, අඩි දෙකක් පමණ දිග ඍජු කෝණාශ්‍රාකාර මතුපිටක් සහිත ඒ මත කෙසෙල් පතුරු ඇතිරිණ. වහලය වශයෙන්, වියූ ගොක් අත්තක් උඩට දැමිණ. ගොක්කොළ සැරසිලිවලින් හැම කෝටුවක් ම සැරසූ අතර වඩා නොමේරූ කෙසෙල් අත්තක් ඒ මත එළුවේ ය.



**නිර්මාණකරුවකුගේ මතක සටහන්**

**සනත් පියසේන**

ඉතිරි කරගත් කෙසෙල් බඩයෙන් අඟල් තුනක් පමණ දිග කෑලි හතක් කපා පසෙකින් තබා ගොක්කොළයෙන් ඉතාමත් හැඩ පළාපෙති මෝස්තර කපා ලියකම් සකස්කොට එම කෙසෙල්බඩ කැබලි වටේ ගැසුවේ ය. සාදා සකස්කර අවසන් වූ විට කෙසෙල්බඩ කැබැල්ල නෙළුම් මලක් පිපිලා වගේ ඉතාමත් අලංකාර ය. එමෙන් හතක් සාදා ඇත්තේ හත්අඩියේ දෙහි කැපීමට ය.

මෙසේ වැඩ කරමින් සිටින විට කොහේදෝ ගමනක් යමින් සිටි හරොංසිංඤෙද්‍රා කට්ටඩිමාමා ද අපේ ගෙදරට ගොඩ වී බුලත්විටක් කා සැරසිලි කිරීම සඳහා ගොක්කොළ කපා දීමෙන් විලියම් මාමාට උදව්පදව් කොට වෙරළුගස් තොටුපළ පැත්තට ගියේ කුමක් හෝ ඔහුට ම වැදගත් වූ අවශ්‍යතාවකට වෙනත් කෙනෙකු සොයනු පිණිස ය.

සවස හතරපහ වනවිට ශාන්තිකර්මයට අවශ්‍ය සියලු ම දෑ සකස්කොට අවසන් ය. මිදුලේ සකස-කොට තිබූ මල් පැල සියල්ල ම වාගේ අපේ ඉස්තෝප්පුවේ පහළකඩේ පැත්තට ඇති කෙළවරේ ක්‍රමවත්ව තැබිණ. ඒවා තැබීමට කලින් ආතා ලොයිබංකුව අයින්කොට ඉතාමත් හොඳින් අතුගා විලියම් මාමා විසින් දෙන ලද කොතලයෙන් කහවතුර ඉස්සේ පුවක්කනිති කැබැල්ලකින් ය. රාත්‍රියට මස්මාංශවලින් තොරව ආහාර ගැනීමෙන් පසු විලියම් මාමා අල්ල මත පුවකයක් තබා මුවහත් පිහියෙන් ලියා බුලත්විටක් ඒදා මුව තුළට රුවා ගත්තේය. රෙදි නැන්දා ගෙන ආ සුදු පිරුවටයක් ඇඳගෙන තවත් පිරුවටයක් නවා කරේ දමාගත් විලියම් මාමා ශාන්ති කර්මයේ වැඩ කටයුතු ආරම්භ කළේ ය. දුම් කබලට අඟුරු ගෙන්වා ගත් ඔහු සාම්බ්‍රාණි කුඩු දමා සෑම මල්පැලකට ම දුම් ඇල්ලුවේ ය.

ගෙදර සියල්ලන් ම පිරිසිදු ඇඳුමින් සැරසී පැමිණි පසු පහන් තැබීම පටන් ගත්තේ විලියම් මාමා ය. ආතුරයා මා ය. මට ද සුදු පිරුවටයක් අන්දා ඉස්සර කරගෙන පැමිණි ආච්චි ද ලොකු මල්පැල ළඟ සිට පන්සිල් ගත්තා ය. මට ද පන්සිල් හොඳින් කට පාඩම් ය. මම හැමටම වඩා ශබ්ද නගා පන්සිල් පද කීවෙමි.

වෙන ම පැදුරක් දමා, ඒ මත මට වාඩි වීමට සැලැස්සූ විලියම් මාමා ශාන්ති කර්මය පටන් ගත්තේ ය. "උතුම් බුදු රුවනේ - දෙවනුව දහම් සරණෝ - සමග සඟ රුවනේ - වඳිම් සතොසින් මෙතුන් සරණෝ" යනුවෙන් ආරම්භකොට දිගින්දිගට ම කවි කියමින්, විටෙක මල්පැල දෙසට හැරී, විටෙක දෑත් දෙපසට විහිදුවා පුවක්කිනිත්ත මා වෙතට හරවා පහත් කරයි. පාද තැබීම ද කිසියම් රිද්මයකට අනුව සිදුවේ. පුවක්මල්කිනිත්ත මා වෙතට පහත් කරන විට ආවැඩිය යුතු ය. ඒ සඳහා පියතිලක බාප්පා මා ළඟින් ම වාඩි වී සිටියේ ය. විලියම් මාමා මා වෙතට අත පහත් කරන සෑම විටකම ඔහු "ආයිබෝ" යනුවෙන් තරමක් ශබ්දයෙන් කියයි. අල්ලිස් මාමා, නැන්දා, පුංචිආච්චි, මීගහතැන්නෙ ආච්චි, ලීලනැන්දා, ශීලනැන්ද, ඉන්ද්‍රානැන්දා, චන්ද්‍රානැන්දා ආදී තරමක පිරිස අපේ ගෙදර මිදුලේ සිටිති.

පැත්තක වාඩි වී තොවිලය දෙස බලා සිටි මාමා ටිකකින් හිස සොලවන්නටත් දඟලන්නටත් පටන් ගත්තේ ය. සෑම දෙනෙකුගේ ම අවධානය ඔහු වෙත යොමුවිණි. ටික වේලාවක් එසේ දඟලමින් සිටි මාමා එක විටම නැගිට මහා හයියෙන් හූවක් කියා මිදුලට පැන පාර දිගේ දිව යන්නට විය. ඒ පිටුපසින් කීප දෙනෙක් ම දිවගිය ද මාමා ආගිය අතක් සොයා ගන්නට බැරිවිය. ග්‍රහ පූජාවට කවි කියමින් සිටි විලියම් මාමා කිසිම කලබලයක් නැත. ඔහු පුටුවක වාඩි වී පුවක් ලියන්නට පටන් ගත්තේ බුලත්විටක් කෑමට ය.

*පැත්තක වාඩි වී තොවිලය දෙස බලා සිටි මාමා ටිකකින් හිස සොලවන්නටත් දඟලන්නටත් පටන් ගත්තේ ය. සෑම දෙනෙකුගේ ම අවධානය ඔහු වෙත යොමුවිණි. ටික වේලාවක් එසේ දඟලමින් සිටි මාමා එක විටම නැගිට මහා හයියෙන් හූවක් කියා මිදුලට පැන පාර දිගේ දිව යන්නට විය.*

"ඔය කොහේ හරි ඉඳල උදේට ගෙදර එයි. ඌට ඇති පිස්සුවක් නැහැ. තියෙන්නෙ සයිඩර් පිස-"සුව. මෙන්න මෙහෙන් වාඩි උනානං මේ වැඩේ කරන්න" කියමින් විලියම් මාමා පඩික්කම ඇද ඇඟිලි දෙක දෙ තොල මත තබා පාත් වී කෙළ ගසා පුවක්මල්කිනිත්ත අතට ගත්තේ ය. එහෙත් දැන් ආවඩ දෙන අයත් නැත. මිදුලේ ඉන්නේ බවලත් උදවිය කීප දෙනෙකු පමණ ය.

ටික වේලාවකින් පසු රොමියෙල් බාප්පාත්, පහළ ධර්මදාස බාප්පාත් මාමාගේ දෑත තම කර දෙපසට දමා තඩලාගෙන ගෙදරට ගෙනැවිත් බිම ඉන්දුවෝ ය. ආතා කේන්තියෙන් මාමාට ගසන්නට පය එසෙව්ව ද අනිත් අය ගහන්නට දුන්නේ නැත. මාමා ඇස් පියා ගෙන ය. විලියම් මාමා වතුර ටිකක් ගෙන මතුරා මාමාගේ මූණට ඉස්සේය. එවිට උඩට ඇද හුස්ම ගත් මාමා ඇස් දෙක ඇර වට පිට බලන්නට විය.

"නෝමිස් සිංඤෙදා විකාර කරන් නැතුව හිටින් මේ වැඩේ කරගන්න දීල." කියමින් විලියම් මාමා නැවත තම කාර්යයෙහි යෙදුනේ ය. හත්අඩියේ දෙහි කැපීම ද මගේ සිත් ගත් අවස්ථාවකි. මුලින් සාදා පසෙක තිබුණු පියුම් හත එකින්එක අතට ගත් විලියම් මාමා කවි කියන්නේ මට සෙත් පතමිනි. පියුම් සියල්ල රවුමට තබා කවි කියයි. මේ සියළු කාර්යයන්හිදී ඩේවිඩ් බාප්පා ඔහුට අඩුවැඩිය සපයයි. උදව් කරයි.

වරින් වර අලුවා සහ ඇඹුල් කෙසෙල්ගෙඩි සමග තේ වතුර ගෙන ආවේ අම්මා ය.

එළිවන විට මා අවදිකර වත්තන් කරගත් ආච්චි ඇගේ ඇඟට මා හේත්තු කර ගත්තා ය. පුංචි පුටුවක වාඩි වී සිටි විලියම් මාමා කහපාට නූලකින් ගැට ගැසූ කුණ්ඩු තුනේ තඹ සුරයක් මගේ කර වටා දමා ගෙන මතුරන්ට පටන් ගත්තේ ය. දෙහි කපා දමන ලද භාජනය පසෙක තිබිණි. අවසානයේ යන්ත්‍රයේ ගැටය තද කොට "දැන් ඔන්න ඔක්කොම හොඳයි " කියූ විලියම් මාමා නැගිට්ටේ ය.

''අනේ විලියොන් සිංඤෙදා ලොකු කොලුවට තියෙන්නෙ මහසෝන් දිස්ටියක් ද, පෙරේත දෝසයක්ද '' යනුවෙන් ආච්චි විලියම් මාමා නැගිටිනවාත් සමගම ඇසුවේ දෙනෙතේ කඳුළු පුරවාගෙන ය.

''ඌට ඇති කෙහෙල්මල් දෝසයක් නෑ. ඔය ඔක්කොම බොරුවට. දෝසයක් තියෙනව නම් නිකං වතුර ගැහුවම සිහිය එනවයැ.'' විලියම් මාමා සිනාසෙමින් කීවේ ය.

හාතාවාරියා කැඳ කෝප්පයක් පමණක් පානය කොට ආපසු යාමට සැරසුණු විලියම් මාමා අතට දීමට, ආච්චි රුපියලේ කොළ තුනක් ඉලත්තට්ටුවේ තබා මට දුන්නා ය. ඉලත්තට්ටුව අතට ගත් විලියම් මාමා එයින් රුපියල් දෙකක් රැගෙන අනිත් රුපියල ආපසු ඉලත්තට්ටුව සමග ආච්චි අතට දී ආපසු යාම සඳහා මිදුලට බැස්සේ සාලුව දෙකට නවා කරට දමාගෙන එක අතකින් සරම පිටුපසින් තරමක් උඩට කරගෙන මිට නැවුණු කුඩය කරේ එල්ලාගෙන දකුණතේ ඇඟිලි දෙකක් කටට තබා මිදුලේ ගස්ලබු ගස යටට රතුපාට කෙළ පහරක් විදිමිනි.

U.D. Electricals
ඔබේ සියළුම ගෘහ විදුලි අවශ්‍යතා සඳහා
බලයලත් විදුලි ශිල්පී
Registered Electrical Contractors and Licenced Electrician (Rec 17240)
Down lights, Power points,
Sensor lights, Exhaust fans,
Heter lights, Safty switches,
Upgradig fuse boards
All Electrical Work
Call Upali 0422 052 425/ 03 97056697
Narre Warren
Reasonabe Rates + All Work Gurenteed